# 2022 පෙබරවාරි මස මාසික සභා රැස්වීම

## වැලිගෙපොල ප්‍රාදේශීය සභාව

2022 පෙබරවාරි මස මාසික සභා රැස්වීම 2022.02.10 වන දින පෙ.ව. 10.00 ට ගරු සභාපති කැළුම් ප්‍රියංකර ජයසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී පවත්වනු ලැබිය.

එදින සභා රැස්වීමට පහත නම් සඳහන් අය සහභාගී වූහ.

1. ගරු උප සභාපති - ඩබ්ලිව්.ඒ.සමන්ජීවලාල් වීරසිංහ මැතිතුමා
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ජී.ජී.සිසිර ප්‍රේමකුමාර මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර්.ඒ.රෝහණ විජේරත්න මැතිතුමා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.බුද්ධික විරසිංහ මැතිතුමා
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.එච්.සිරිපාල මැතිතුමා
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - අචිනි එස්.අබේවික්‍රම මැතිතුමිය
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එල්.ඒ.ගුණතිලක මැතිතුමා
8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එම්.ආර්.රත්නපාල මැතිතුමා
9. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.එම්.අයි.පී.රණතුංග මැතිතුමා
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එච්.ඒ.දමිත් විජේරත්න මැතිතුමා
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ජී.එල්.ලාල් කුමාරරත්න මැතිතුමා
12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - එන්.වී.ශ්‍රීමාවතී මැතිතුමිය
13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.ජී.ශාන්ත දෙල්ගහකොට්ටුව මැතිතුමා
14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.කේ.ප්‍රසාද් අසිත මැතිතුමා
15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - ඒ.ඩබ්ලිව්.සුමනාවතීමැතිතුමිය
16. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එන්.ජී.යූ.ඩබ්ලිව්.කුමාර මැතිතුමා

## නිලධාරී සහභාගීත්වය

1. ප්‍රාදේශීය සභාවේ ලේකම් - එස්.රත්නාවතී මැණිකේ මෙනවිය
2. කළමනාකරණ සේවා නිලධාරී - එච්.ඒ.පී.එන්.හෙට්ටිආරච්චි මිය

මෙදින සභා රැස්වීමට සහභාගී වූ ගරු සභාපති තුමා විසින් ගරු උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයත්,ලේකම් තුමිය ඇතුළු කාර්යමණ්ඩලයත්,මාධ්‍යවේදී මහතාත් පිළිගැනීමෙන් අනතුරුව මෙම සභාවේ සභිකවරයකු ලෙස කටයුතු කල ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.සී.සිසිර කුමාර ඉසුරුමුණි මැතිතුමා 2022.02.03 වන දින අභාවප්‍රාප්ත වූ බැවින් එතුමා ගුණානුස්මරණය කිරීම වෙනුවෙන් විනාඩි දෙකක නිහඬතාවක් රැකීමෙන් පසු සභාවේ කටයුතු ආරම්භ කරන ලදී.

### 1. පසුගිය සභා රැස්වීමේ වාර්තාව සහා සම්මත කිරීම

2022.01.13 වන දින මාසික සභා රැස්වීම් වාර්තාව සත්‍ය වාර්තාවක් බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.සිසිර ප්‍රේමකුමාර මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එච්.සිරිපාල මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.2022.01.13 මාසික සභා රැස්වීම් වාර්තාවේ තීරණ අංක 5.1.(VI) යෝජනාවේ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ජී.යූ.ඩබ්ලිව්.කුමාර මැතිතුමා විසින් 252-6373 කැබ් රථයේ පසුගිය වසර හතරක අළුත්වැඩියාවන් සිදු කිරීම සම්බන්ධව වාර්තාවක් අවශ්‍ය බවට කරන ලද ප්‍රකාශය වාර්තාවේ සඳහන්ව නොමැති බව ගරු මන්ත්‍රීතුමා විසින් සඳහන් කරන ලදී.එම සංශෝධනයට යටත්ව 2022.01.13 මාසික සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

## 2. ගරු සභාපතිතුමාගේ නිවේදන

### 2.1. ජල බිල් පතේ නම සංශෝධනය කිරීම

ඩී.ලීලාවතී නමින් ඇති අංක UD 100 දරණ ජල බිල් පත ඩබ්.එම්.එන්.සම්පත් යන නමින් සංශෝධනය වන බව සභාවේ දැනගැනීම සඳහා ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලදී.

### 2.2. සබරගමුව පළාතේ පළාත් පාලන ආයතන වල ප්‍රධානීන් හා කාන්තා කමිටු සභාපතිනියන් සඳහා පැවැත්වෙන විශේෂ නේවාසික වැඩමුළුව

ඉහත කරුණට අදාලව පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ අධ්‍යක්ෂක විසින් එවා ඇති ලිපියකට අනුව රේඛීය අමාත්‍යාංශයේ මගපෙන්වීම පරිදි පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය මගින් කාන්තා නියෝජනය උදෙසා කටයුතු කරන බාහිර ආයතනයක පූර්ණ අනුග්‍රහය මත පළාත් සභා හා පළාත් පාලන කටයුතු පිළිබඳ රාජ්‍ය අමාත්‍ය රොෂාන් රණසිංහ මැතිතුමාගේ ද සහභාගිත්වයෙන් 2022.02.26 හා 27දෙදින වැඩමුළුවක් පැවැත්වීමට කටයුතු සූදානම් කර ඇති බවත් ඒ සඳහා සභාවේ සභිකවරියක සහභාගී කරවන ලෙසත් දන්වා පළාත් පාලන කොමසාරිස් විසින් එවන ලද අංක CLG/AD/1/7/7 හා 2022.02.10 දිනැති ලිපිය දැන ගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.

### 2.3. ගම සමග පිළිසඳරක් - වැඩ සමග යළි ගමට වැඩසටහනට සමගාමීව සබරගමු පළාතේ ආන්තික ගම්මාන සංවර්ධන වැඩසටහන - සබරගමුව අරුණැල්ල

ඉහත වැඩසටහන යටතේ පරිපූරක මුදල් ප්‍රකාශයක් හරහා අමාත්‍යාංශය අනුමත කරන ලද කර්මාන්ත ප්‍රගතිය දක්වා ප්‍රධාන අමාත්‍යාංශය විසින් එවන ලද අංක CM/DE/05ඇස්තමේන්තු 2021/වෙළුම II හා 2022.01.21 දිනැති ලිපිය සභාවට ඉදිරිපත් කරන ලදී.

### 2.4. මාර්ග රක්ෂිතයේ ලොතරැයි කුටි ප්‍රදර්ශනය කිරීම

මාර්ග සංවර්ධන අධිකාරිය පැල්මඩුල්ල විධායක ඉංජිනේරු කොට්ඨාශයට අයත් කොළඹ රත්නපුර වැල්ලවාය මඩකලපුව මාර්ගයේ 131/2 – 132/3 අතර වම්පස ස්ථානයෙහි පවත්වාගෙන යනු ලබන ලොතරැයි කුටි අංක 01 සඳහා අනුමැතිය ලබාදී ඇති බව දන්නවා මාර්ග සංවර්ධන අධිකාරිය විධායක ඉංජිනේරු විසින් එවන ලද ලිපියේ පිටපත සභාවේ දැනගැනීම පිණිස ඉදිරිපත් කරන ලදී.

### 2.5. උත්සව රැස්වීම් සැණකෙළි සංගීත සංදර්ශන ආදිය සඳහා පළාත් පාලන ආයතන වල ශාලාවන් ක්‍රීඩා පිටිය සහ එළිමහන් පරිශ්‍ර ලබාදීම.

පවතින කොරෝනා වසංගත තත්ත්වය පාලනය කිරීම සඳහා සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් මේ වන විට නිකුත් කර ඇති සෞඛ්‍ය මාර්ගෝපදේශ වලින් බැහැරව කිසිදු අවස්ථාවක මහජනතාව එක්රැස් වන රැස්වීම් හා උත්සව සඳහා පළාත් පාලන ආයතන යටතේ පවතින ක්‍රීඩාපිටි උත්සවශාලා රැස්වීම් ශාලා සහ එළිමහන් පරිශ්‍ර ලබා දීම හෝ එවැනි උත්සව සඳහා එකඟතාවයක් හෝ අනුමැතියක් ලබා දීම සිදු නොකරන ලෙස දන්වා පළාත් පාලන කොමසාරිස් විසින් එවන ලද අංක CLG/AD/02 හා 2022.01.21දිනැති ලිපිය සභාවට ඉදිරිපත් කරන ලදී.

## 2.6. වාර්තාවක් කැඳවීම සම්බන්ධවයි

උඩවෙල අකරැල්ල මාර්ගයේ මාර්ග තදබදය සඳහා විකල්ප සලකා බැලීම මැයෙන් ගරු සභාපතිතුමා විසින් ගරු ආණ්ඩුකාරතුමා වෙත යොමු කරන ලද ලිපියකට අනුව උඩවෙල අකරැල්ල මාර්ගයේ පවතින තදබදය සම්බන්ධව සවිස්තර වාර්තාවක් පළාත් මාර්ග සංවර්ධන අමාත්‍යාංශය වෙත ලබා දෙන ලෙස දන්වා පළාත් මාර්ග අමාත්‍යාංශයේ ලේකම් විසින් පැල්මඩුල්ල විධායක ඉංජිනේරු වෙත යොමු කරන ලද අංක SG/MPR/DE/08 හා 2022.01.18 දිනැති ලිපිය සභාවේ දැනගැනීම පිණිස ඉදිරිපත් කරන ලදී.

## 2.7. ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන- 2021 ව්‍යාපෘති පවරාදීම.

පහත සඳහන් ව්‍යාපෘති නඩත්තු කටයුතු සඳහා ප්‍රාදේශීය සභාව වෙත පවරා දෙන බව දන්වා ඕපනායක ප්‍රාදේශීය ලේකම් විසින් එවන ලද අංක OPDS/PLD/DV/01/SMRR COM/2021 හා 2022.01.24 දිනැති ලිපිය දැනගැනීම පිණිස සභාවට ඉදිරිපත් කරන ලදී.

| අනු අංකය | ව්‍යාපෘතියේ නම | ග්‍රාම නිලධාරී වසම | අනුමත ප්‍රතිපාදන මුදල |
|---|---|---|---|
| 01. | අක්කර 18 කෙසෙල්වත්ත පන්සල මාර්ගය සංවර්ධනය කිරීම | මැටිහක්වල | 500,000.00 |
| 02. | මිල්ලකඩේ සිට නුගගේන දක්වා මාර්ගය සංවර්ධනය කිරීම | මැටිහක්වල | 1,000,000.00 |
| 03. | මැටිහක්වල ගම්මැද්ද මාර්ගය | මැටිහක්වල | 2,000,000.00 |
| 04. | වලව්වත්ත අසල සිට අරඹෙවත්ත හරහා මල්මීකන්ද කඩේ අතුරු මාර්ගය | මල්මීකන්ද | 500,000.00 |
| 05. | මල්මීකන්ද ගොවිපල මාර්ගය | මල්මීකන්ද | 500,000.00 |

## 2.8. විමධ්‍යගත සංවර්ධන වැඩසටහන 2021

ඉහත වැඩසටහන යටතේ ඕපනායක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ ක්‍රියාත්මක කිරීම සඳහා සංවර්ධන ව්‍යාපෘති 7ක නඩත්තු කටයුතු සඳහා ප්‍රාදේශීය සභාව වෙත පවරා දෙන බව දන්වා ඕපනායක ප්‍රාදේශීය ලේකම් විසින් එවන ලද අංක OPDS/PLD/F03/DCB/MAIN/1/2022 හා 2022.01.21 දිනැති ලිපිය දැනගැනීම පිණිස සභාවට ඉදිරිපත් කරන ලදී.

## 2.9. පළාත් පාලන ආයතන ධූරකාලය දීර්ඝ කිරීම සම්බන්ධ ගැසට් නිවේදනය

එක් එක් ප්‍රාදේශීය සභාවේ සභිකයින්ගේ ධූර කාලය අවසන් වන දිනය 2023 මාර්තු 10 වන දින දක්වා දීර්ඝ කර ඇති බව දන්වා රාජ්‍ය සේවා පළාත් සභා හා පළාත් පාලන ගරු අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් ඇමතිතුමා විසින් නිවේදනය කරමින් නිකුත් කරන ලද අතිවිශේෂ ගැසට් නිවේදනය සභාවට ඉදිරිපත් කරන ලදී.

3. <u>**සභාව නමින් ලැබී ඇති ලිපි,පෙත්සම් හා පැමිණිලි ඉදිරිපත් කිරීම**</u>

### 3.1. නිවාඩු අනුමත කර ගැනීම.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.ඉන්ද්‍රජිත් සමන්ජීව මැතිතුමා, සහ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී පී.ආර්.එස්.ධම්මිකා මැතිතුමිය අසනීප වීම හේතුවෙන් අද දින සභා රැස්වීමට සහභාගී නොවන බව දන්වා එවා ඇති බැවින්,නිවාඩු අනුමත කිරීම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.සිසිර ප්‍රේමකුමාර මැතිතුමා විසින් යෝජනා කිරීමෙන් හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එච්.සිරිපාල මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් පසුව එම නිවාඩු අනුමත විය.

### 3.2. තලගස්කන්ද ක්‍රීඩා පිටිය සංවර්ධනය කිරීමේ ජාතික වැඩසටහන 2022

ඉහත ව්‍යාපෘතිය යටතේ තලගස්කන්ද ක්‍රීඩාපිටිය සංවර්ධනය කිරීමට යෝජිත බැවින් ඒ සඳහා එකඟතාව ඉල්ලා වැලිගෙපොල ප්‍රාදේශීය ලේකම් විසින් එවන ලද අංක WEDS/PLD/DV/5/OMDP/08/2022 හා 2022.02.08 දිනැති ලිපිය සභාවට ඉදිරිපත් කරන ලදී.

### 3.3. බඹරගල සේවා පියස පිහිටි ඉඩම අත්පත් කර ගැනීම

වැලිගෙපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ගල්ලෙනයාය නැමැති ඉඩම ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු ඉඩමක් වන අතර බඹරගල සේවාපියස, ප්‍රජාශාලාව හා පෙර පාසැල් ගොඩනැඟිල්ල ඉදි කර ඇති බවත්, මෙම ඉඩම ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය වෙත අත්පත් කර ගැනීම සඳහා අදාළ පළාත් පාලන ආයතනයේ එකගතාවය අවශ්‍ය වන බැවින් ඒ සඳහා එකඟතාවය ලබා දෙන ලෙස ඉල්ලා වැලිගෙපොල ප්‍රාදේශීය ලේකම් විසින් එවන ලද අංක WEDS/LND/9/ACQ/2-21 හා 2022.02.07 දිනැති ලිපිය සභාවට ඉදිරිපත් කරන ලදී.

### 3.4. කැන්දකැටිය පොදු සුසාන භූමියේ තිබෙන ලුනුමිදෙල්ල ගසක් කපා ඉරා ගැනීමට අවසර ඉල්ලීම

කැන්දකැටිය ග්‍රාම නිලධාරි වසමේ ශ්‍රී සුබෝධි දහම් පාසලේ ප්‍රධානාචාර්ය විසින් එම දහම් පාසල පවත්වාගෙන යන බෝධිමලු විහාරයේ තිබෙන ප්‍රජා ශාලාවේ වහලය දිරා ගොස් ඇති බැවින්, එය පිළිසකර කර ගැනීම සඳහා අවශ්‍ය ලී සපයා ගැනීමට කැන්දකැටිය පොදු සුසාන භූමියේ තිබෙන ලුනුමිදැල්ල ගස කපා ඉරා ගැනීමට අවසර ඉල්ලා ඇති බැවින් ඒ සඳහා නුමැතිය ලබා දෙන ලෙස ඉල්ලා ඕපනායක ප්‍රාදේශීය ලේකම් විසින් එවන ලද ලිපියේ සභාවට ඉදිරිපත් කරන ලදී.

### 3.5. ගල්පාය කිරි සමිතිය පවත්වාගෙන යාම සඳහා කඩ කාමරයක් ලබා ගැනීම සම්බන්ධවයි.

ගල්පාය කිරි සමිතිය පවත්වාගෙන යන ගොඩනැගිල්ල මේ වන විට ඉතා අබලන් තත්වයට පත්වී ඇති බැවින් ගොඩනැගිල්ලක් ඉදිකිරීමට අදාල ව්‍යාපෘති වාර්තාවක් අමාත්‍යාංශය වෙත යොමු කර ඇති බැවින් එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන තෙක් කිරි සමිතිය පවත්වාගෙන යාම සඳහා ගල්පාය පොළ පවත්වාගෙන ස්ථානයේ කඩකාමරයක් ලබාදෙන ලෙස ඉල්ලා වැලිගෙපොල පශු වෛද්‍ය නිලධාරීන් විසින් එවන ලද අංක 20/සං/පශු/වැලි/226 හා 2022.01.31 දිනැති ලිපිය සභාවට ඉදිරිපත් කරන ලදී.

### 3.6. උතුරු හුණුවල ග්‍රාම නිලධාරී වසමේ ඉඹුල්තැන්න රජයේ ඉඩමේ යෝජිත නාය අධි අවදානම් නිවාස ව්‍යාපෘතියේ ඉදිකිරීම් සඳහා ජලය ලබා ගැනීම

ඉඹුල්තැන්න රජයේ ඉඩමෙන් බිම් කොටස් ලබා දී රජය මගින් නිවාස ඉදි කිරීම සඳහා මේ වන විට අදාල ප්‍රතිපාදන අදියර කිහිපයකින් වාරික වශයෙන් ගෙවීම් කටයුතු කරමින් පවතින අතර අදාල ස්ථානය සඳහා මෙතෙක් ජල පහසුකම් නොමැති බැවින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී දැඩි අපහසුතාවයට ලක්වන බවත්, නිවාස ව්‍යාපෘතියට අදාල නිවෙස් සඳහා තාවකාලිකව සතියකට අවස්ථා දෙකක දී හෝ ජල බවුසරය උපයෝගී කර ගනිමින් ජලය සැපයීමට හැකියාවක් පවතින්නේ නම් එය එම ප්‍රතිලාභීන් වෙත කල හැකි වටිනා උපකාරයක් වන බැවින් ඒ සඳහා විශේෂ අවධානය යොමු කර සුදුසු වැඩපිළිවෙළක් සකස් කර දෙන ලෙස ඉල්ලා ඕපනායක ප්‍රාදේශීය ලේකම් විසින් අංක OPDS/SOD/DM/01/12/resettle හා 2022.01.28 දිනැතිව යොමු කරන ලද ලිපිය සභාවට ඉදිරිපත් කරන ලදී.

### 3.7. මාර්ගය පිළිබඳව දැනුම් දීමයි

වැලිගෙපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ රංවල ග්‍රාම නිලධාරී වසමේ උඩ ගම්මැද්ද මාර්ගයේ අවසාන කෙළවර කඳු සහිත වාහන ගමන් කල නොහැකි මීටර් 500ක් පමණ දුරක් සෝදාපාලුවට ලක්වෙමින් විනාශ වෙමින් පවතින අතර එය සකස් කර දෙන ලෙස ඉල්ලා අතිගරු ජනාධිපතිතුමා වෙත යොමු කරන ලද ලිපියකට අනුව ඒ සම්බන්ධයෙන් සොයා බලා කටයුතු කරන ලෙස දන්වා පළාත් පාලන කොමසාරිස් විසින් එවන ලද අංක CLG/LG/02/01/04/06 හා 2022.01.24දිනැති ලිපිය සභාවට ඉදිරිපත් කරන ලදී.

### 3.8. කැන්දකැටිය තණබිම මාර්ගය සකස් කිරීම

පල්ලෙකන්ද කැන්දකැටිය මාර්ගයේ කිලෝ මීටර තුනක් පමණ ගමන් කල පසු ව ඇල්ලෙ කන්ද නම් ප්‍රදේශයේ මෙම මාර්ගයේ පිහිටා ඇති අතර මෙම මාර්ගය ප්‍රාදේශීය සභා මාර්ගයක් ලෙස විධිමත්ව ප්‍රකාශයට පත් කිරීමේ හැකියාව සොයා බලා කටයුතු කරන ලෙසත් අනතුරුව සාධ්‍යතාව පරීක්ෂාකර මාර්ග සංවර්ධනය සඳහා එහි ශක්‍යතාවය මත සංවර්ධන සඳහා ඇතුළත් කරන ලෙසත් දන්වා පළාත් පලන සහකාර කොමසාරිස් විසින් එවන ලද අංක ACLG/09/04/08 හා 2022.01.21 දිනැති ලිපිය සභාවට ඉදිරිපත් කරන ලදී.

## 4. <u>යථා පරිදි කල්දී ඇති ප්‍රශ්න</u>

යථා පරිදි කල්දී ඇති ප්‍රශ්න කිසිවක් නොවීය

## 5. <u>කල් දී ඇති යෝජනා</u>

### 5.1. ගරු සභාපති කැළුම් ප්‍රියංකර ජයසිංහ මැතිතුමා

ගරු සභාපතිතුමා විසින් පහත සඳහන් යෝජනා සභාවට ඉදිරිපත් කරන ලදී.

I. ගරු සභාපතිතුමා විසින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට සහ 1987 අංක 15 දරණ පනතේ 171 වගන්තිය අනුව විෂයභාර අමාත්‍යවරයා විසින් ප්‍රාදේශිය සභා උප නිති වශයෙන් සම්මත

ප්‍රාදේශිය සභා මුල්‍ය හා පරිපාලන නිති වලට අනුගත වෙමින් 2021 වර්ෂය සඳහා මෙම සභාව විසින් පිළියෙල කරන ලද මුල්‍ය ප්‍රකාශය විගණනය වෙත ඉදිරිපත් කිරිම පිණිස මහා සභාවේ අනුමැතිය ලබා දෙන ලෙස ඉල්ලා සිටින ලදි.

එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.එච්.සිරිපාල මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

ගරු සභාපතිතුමා විසින් සභාව අමතමින් රාජ්‍ය මුදල් චක්‍රලේඛ 267/2018 අනුව පෙබරවාරි 28 හෝ ඊට පෙර දිනයක මුල්‍ය ප්‍රකාශය විගණන සඳහා ඉදිරිපත් කළ යුතුව ඇති බවත්, මෙම මුල්‍ය ප්‍රකාශය විගණනය මඟින් පරීක්ෂාවට ලක් කරන බවත්,සඳහන් කරන ලදී.ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

II. 2022 වර්ෂයේ සිට 2026 වර්ෂය දක්වා පිළියෙල කර ඇති ආයතනයේ උපායමාර්ගික සැලැස්ම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම අවශ්‍ය බව යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.සිසිර ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

III. සභාවේ ප්‍රයෝජනය සඳහා ප්‍රොජක්ටර් එකක් මිලදී ගැනීම අවශ්‍ය බවත්,

IV. කාර්යාලීය අවශ්‍යතාව සඳහා පරිගණක 04,පරිගණක මේස 03 පුටු 03, මේස 10,පුටු 10,කැෂියර් මැෂින් 01 ,මිලදී ගැනීම අවශ්‍ය බවත් යෝජනා කරන ලදී.

ඉහත III සහ IV යෝජනා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.ඒ.ගුණතිලක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දැක්වූ ගරු සභාපතිතුමා සභාවේ පවත්වන පුහුණු වැඩසටහන් හා වෙනත් විවිධ වැඩසටහන් සඳහා ප්‍රොජෙක්ටර් යන්ත්‍රයක අවශ්‍යතාව පවතින බවත්,හෙළ බොජුන්හල සඳහා කැෂියර් මැෂින් එකක් අවශ්‍ය බවත්,කාර්යාලීය ප්‍රයෝජනය සඳහා ඉහත උපකරණ මිලදී ගැනීම අවශ්‍ය බවත්,ප්‍රකාශ කිරීමෙන් අනතුරුව ඉහත යෝජනා දෙක ඒකමතිකව සභා සම්මත විය.

V. 2021 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව සඳහා සභා අනුමැතිය අවශ්‍ය බව යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ජී.ශාන්ත දෙල්ගහකොට්ටුව මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී ගරු සභාපතිතුමා 2021 වර්ෂයේ වැලිගෙපොල ප්‍රාදේශීය සභාව සතු සියළු ඉන්වෙන්ට්‍රි ගත භාණ්ඩ සමීක්ෂණය කර සකස් කරන ලද වාර්තාවට සභා අනුමැතිය ලබා දෙන ලෙස ඉල්ලා සිටින ලදී.ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

VI. භාණ්ඩ වෙනදේසි මණ්ඩලය පත්කර ගැනීම අවශ්‍ය බවත්,

VII. භාණ්ඩ අපහරණ මණ්ඩලය පත්කර ගැනීම අවශ්‍ය බවත්, යෝජනා කරන ලදී.

එම යෝජනා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.බුද්ධික වීරසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.
ඒ අනුව ,

වෙන්දේසි මණ්ඩලය ලෙස

- ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඒ.රෝහණ විජේරත්න මැතිතුමා
- ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ඒ.ඩබ්ලිව්.සුමනාවතී මැතිතුමිය
- කාර්මික නිලධාරී
- ආදායම් පරිපාලක
- ගිණුම් විෂය නිලධාරී
- විෂය නිලධාරී
- ප්‍රජා සංවර්ධන නිලධාරී (අධීක්ෂණය සඳහා) ද,

අපහරණ මණ්ඩලය ලෙස

- ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.සිසිර ප්‍රේමකුමාර මැතිතුමා
- ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ජී.යූ.ඩබ්.කුමාර මැතිතුමා
- කාර්මික නිලධාරී
- ආදායම් පරිපාලක
- ගිණුම් විෂය නිලධාරී
- විෂය නිලධාරී
- ප්‍රජා සංවර්ධන නිලධාරී (අධීක්ෂණය සඳහා) ද,පත් කර ගන්නා ලදී.

ඒ අනුව ගරු සභාපතිතුමාගේ VI හා VII යෝජනා ඒකමතිකව සභා සම්මත විය.

VIII. ත්‍රී රෝද රථ සංගම් පාලනය සඳහා කමිටුවක් පත් කිරීම අවශ්‍ය බව යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එච්.සිරිපාල මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දැක්වූ ගරු සභාපතිතුමා වාහන වල බර සහ වේගය සීමා කිරීම හා ධාවනය විධිමත් කිරීම පිළිබඳව 2013.12.20 දින ගැසට් පත්‍රයේ පල කරන ලද අතුරු ව්‍යවස්ථාවට අනුව අංක 20 දරණ අතුරු නීතිය ප්‍රකාරව ත්‍රී රෝද රථ සංගම් පාලනය සඳහා කමිටුවක් පත්කිරීම අවශ්‍ය බවත්,ඒ අනුව එහි සංයුතිය පහත සඳහන් පරිදි විය යුතු බවත් ප්‍රකාශ කළේය.

- සභාවේ ගරු සභාපති
- සභාවේ ලේකම්
- අදාල කොට්ඨාශයේ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා ඇතුළුව ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු තිදෙනෙක්
- වාහන විෂය නිලධාරී
- ප්‍රදේශයේ පොලිස් ස්ථානාධිපති හෝ නියෝජිතයකු
- විෂය නිලධාරී

ඒ අනුව ඉහත යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

IX. හොරන්කදුර ප්‍රජාශාලාවේ වහලය සඳහා ෂීට් ලබා දීම සඳහා රු.50000ක වියදම් ඇස්තමේන්තුව අනුමත කර ගැනීම අවශ්‍ය බව යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එච්.සිරිපාල මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දැක්වූ ගරු සභාපතිතුමා,එම ප්‍රජා ශාලාවේ වහලය කැඩී ඇති බැවින් ප්‍රදේශවාසීන්ගේ දැඩි ඉල්ලීම මත මෙම යෝජනාව ඉදිරිපත් කල බව ප්‍රකාශ කරන ලදී.ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

X. වල්ලකැටිය ග්‍රාම නිලධාරි වසමේ වල්ලකැටිය මූකලාන නැමති ඉඩමෙන් පර්චස් 20ක කොටසක් මොබිටෙල් කුළුණක් ඉදිකිරිම සඳහා දිගුකාලීන බදු බලපත්‍ර ලබා දීමට එකඟතාව ලබා දීම අවශ්‍ය බවත්,මහ කුඹුර නැමති ඉඩමෙන් පර්චස් 10ක කොටසක් ඩබ්.චන්ද්‍රලතා මහත්මියට කෘෂිකාර්මික නොවන වෙනත් සංවර්ධන කටයුත්තක් සඳහා ලබා දීමට සභාවේ නිර්දේශය ඉල්ලා ඇති බැවින් එය ලබා දීම අවශ්‍ය බවත් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. ආර්.රත්නපාල මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් පසු ඒකමතිකව සභා සම්මත විය.

XI. පහත කර්මාන්ත සඳහා කොටස් බිල් ගෙවීමට සභා අනුමැතිය අවශ්‍ය බව යෝජනා කරන ලදී.

| වැඩ විෂය | කොන්ත්‍රාත්කරු | ප්‍රතිපාදන ලබා දුන් අමාත්‍යාංශය | බිල්පත් වටිනාකම |
|---|---|---|---|
| වැලිගෙපොල ප්‍රාදේශිය සභාවේ ඉඹුල්තැන්න ක්‍රීඩා පිටිය වැඩි දියුණු කිරිම | රේණුක කන්ට්‍රක්ෂන්,නො.343,පොල්වත්ත,ඕපනායක | ප්‍රධාන අමාත්‍යාංශය | 846,412.09 |
| වැලිගෙපොල ප්‍රාදේශිය සභාවේ කොම්පෝස්ට් අංගනයට අලුතින් කොටසක් එක් කිරිම හා වැසිකිලි පද්ධතියක් ඉදි කිරිම | හත්තැල්ල එකමුතු වැඩිහිටි සංවිධානය,හත්තැල්ල, ඕපනායක | ප්‍රධාන අමාත්‍යාංශය | 2,280,804.39 |
| උඩවෙල තැන්නහේන මාර්ගයේ පැති බැම්ම සංවර්ධනය කිරිම | බටේවෙල ග්‍රාම සංවර්ධන සමිතිය , බටේවෙල,හත්තැල්ල, ඕපනායක | පළාත් මාර්ග අමාත්‍යාංශය | 966,633.13 |
| තලගස්කන්ද ක්‍රීඩා පිටිය සංවර්ධනය කිරිම ( III අදියර) | එකමුතු කෘෂිකර්ම ගොවි සංවිධානය,කලටුවාකන්ද, | පළාත් මාර්ග අමාත්‍යාංශය | 813,515.00 |
| මහවෙල අමුණ ප්‍රතිසංස්කරණය කිරිම | බෙලිමල්ලියද්ද, එකමුතු ගොවි සංවිධානය | ඉඩම් කෘෂි කර්ම අමාත්‍යාංශය | 620,965.15 |

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.අයි.පී.රණතුංග මැතිතුමා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

### 5.2. ගරු උප සභාපති ඩබ්ලිව්.ඒ.සමන්ජීවලාල් වීරසිංහ මැතිතුමා

ගරු උප සභාපතිතුමා විසින් පහත යෝජනාව සභාවට ඉදිරිපත් කරන ලදී.

I. පල්ලෙබැද්ද ගල්පාය ප්‍රධාන මාර්ගයේ මුත්තෙට්ටුපොල කේ.වයි.කරුණාරත්න මහතාගේ නිවස අසලින් ලබුවත්ත හේන්යාය නැමති ගම් කොටසට පිවිසෙන මාර්ගයේ මායිම් නිරවුල් කර ගැනීම අවශ්‍ය බව යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.බුද්ධික වීරසිංහ මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් පසු ඒකමතිකව සභා සම්මත විය.

### 5.3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.බුද්ධික වීරසිංහ මැතිතුමා

ගරු මන්ත්‍රීතුමා විසින් පහත යෝජනාව සභාවට ඉදිරිපත් කරන ලදී.

I. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.සී.සිසිර කුමාර ඉසුරුමුණි මැතිතුමාගේ අවමංගල්‍ය වෙනුවෙන් ලබා දුන් හට් හා පුටු වෙනුවෙන් රු.33,300.00 ක කුලී මුදලක් ගෙවීම අවශ්‍ය බව යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.සිසිර ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහි දී අදහස් දැක්වූ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.බුද්ධික වීරසිංහ මැතිතුමා වැලිගෙපොල ප්‍රාදේශීය සභාවේ එක්සත් ජනතා නිදහස් සංධානය නියෝජනය කරමින් සභිකවරයෙකු වශයෙන් කටයුතු කරමින් සිටියදී 2022.02.03 වන දින අප අතරින් සමුගත් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.සී.සිසිර කුමාර ඉසුරුමුණි මැතිතුමාගේ අවමංගල්‍ය වෙනුවෙන් ලබා දී තිබූ හට් හා පුටු වෙනුවෙන් වැය වූ කුලිය සභා අරමුදලින් ගෙවීම සුදුසු බවත්,සභාවේ සභිකවරයකු වෙනුවෙන් සභාව විසින් මෙම මුදල ගෙවිය යුතු බවත් ප්‍රකාශ කළේය.ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

### 5.4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.සිසිර ප්‍රේමකුමාර මැතිතුමා

ගරු මන්ත්‍රීතුමා විසින් පහත යෝජනා සභාවට ඉදිරිපත් කරන ලදී.

I. නරිස්ස බස්නකන්ද ජල ව්‍යාපෘතියට ජබොස් මෝටරයක් ලබා දීම අවශ්‍ය බව යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ජී.යූ.ඩබ්.කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

හත්තැල්ල එගොඩ හා බටදූර ග්‍රාම නිලධාරී වසම් වලට අයත් නරිස්ස බස්නකන්ද ප්‍රදේශයේ පවුල් 51ක සාමාජිකයින් 350ක් පමණ වෙසෙන අතර ඔවුන් විසින් ගොඩනගාගන්නා ලද ජල ව්‍යාපෘතියකින් ජල අවශ්‍යතාව සපුරා ගන්නා ලද අතර එම ජල ව්‍යාපෘතියේ ජබොස් මෝටරය මේ වන විට අක්‍රීය වී ඇති බැවින් මේ වන විට එම ජනතාව ජලය නොමැතිව දැඩි අපහසුතාවට ලක්වී ඇති

බවත්,මෝටරයක් මිලදී ගැනීමට වත්කමක්ද ඔවුන් සතුව නොමැති බැවින් එම ජනතාව පත්වී ඇති අපහසුතාව සලකා බලා ජබොස් මෝටරයක් ලබා දීම සුදුසු බව ගරු මන්ත්‍රීතුමා විසින් සඳහන් කළේය.

එයට අදහස් එක් කල ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ජී.යූ.ඩබ්.කුමාර මැතිතුමා ,ඉහත යෝජනාව එම ප්‍රදේශයේ ජනතාවට ඉතා අත්‍යවශ්‍ය බව පෙන්වා දෙන ලදී.ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

II. තැන්නෙයාය පෙරපාසලට ලීටර් 500 ටැංකියක් හා අගල් හාගෙ බට 20ක් ලබා දීම අවශ්‍ය බව යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු උප සභාපති ඩබ්ලිව්.ඒ.සමන්ජීවලාල් වීරසිංහ මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් පසු ඒකමතිකව සභා සම්මත විය.

## 6. <u>කාරක සභා වාර්තා සලකා බැලීම.</u>

කාරක සභා වාර්තා කිසිවක් නොමැත

## 7. ආදායම් වියදම් වාර්තා

### 7.1. 2021 දෙසැම්බර් මස ආදායම් වියදම් වාර්තාව

| ලැබීම් සාරාංශය | (රුපියල්) | වැය සාරාංශය | (රුපියල්) |
|---|---|---|---|
| වරිපනම් බදු | 684,843.23 | වැටුප් හා දීමනා | 3,576,564.28 |
| කුලී | 92,141.75 | ගමන් වියදම් | 22,682.00 |
| බලපත්‍ර ගාස්තු | 166,700.00 | සැපයුම් හා උපකරණ | 379,533.00 |
| සේවා සඳහා ගාස්තු | 439,452.20 | ප්‍රාග්ධන වත්කම්අළුත්වැඩියාහා නඩත්තුව | 80,750.00 |
| වරෙන්තු ගාස්තු හා දඩ | 3,702.79 | ප්‍රවාහන සම්බන්ධතා හා ආවශ්‍යක සේවා | 407,236.25 |
| වෙනත් ආදායම් | 40,021.59 | පොලී ගෙවීම් ලාභාංශ හා ප්‍රසාද මුදල් | - |
| වෙනත් ආධාර | 2,802,638.25 | ආධාර මුදල් දායක මුදල් සහනාධාර | - |
| පුනරාවර්ථන ආදායම් එකතුව | 4,193,499.81 | විශ්‍රාම වැටුප්,විශ්‍රාම ප්‍රතිලාභ,හා පාරිතෝෂික | 34,034.65 |
| මූලධන ලැබීම් | - | පුනරාවර්තන වියදම් එකතුව | 4,500,800.18 |
| ප්‍රාග්ධන ආදායම් එකතුව | - | ප්‍රාග්ධන වැය | - |
| පුනරාවර්ථන/ ප්‍රාග්ධනආදායම් එකතුව | 4,193,499.81 | ණය ආපසු ගෙවීම් | - |
| සේවක ණය | 141,964.67 | සේවක ණය | - |
| තැන්පත් | 225,559.52 | තැන්පත් | 80,528.02 |
| අත්තිකාරම් | 20,000.00 | ණයහිමි | - |
| ණය ගැති(කර්මාන්ත) | - | අත්තිකාරම් | 20,000.00 |

| | | | |
|---|---|---|---|
| සමුච්චිත අරමුදල | 400.00 | ජල ගබඩා | - |
| | | ගබඩා(ඖෂධ) | - |
| වෙනත් ලැබීම් එකතුව | 387,924.19 | සමුච්චිත අරමුදල | - |
| | | වෙනත් ගෙවීම් | - |
| | | වෙනත් ගෙවීම් එකතුව | 100,528.02 |
| මුළු එකතුව | 4,581,424.00 | මුළු ගෙවීම් | 4,601,328.20 |

### 7.2. 2021 දෙසැම්බර් 31 දිනට ආදායම් අය කිරීමේ ප්‍රගති වාර්තා

ඇමුණුම 1 යා කර ඇත

## 8. පසු ගිය සභා රැස්වීමේ ප්‍රගතිය සමාලෝචනය කිරීම

- පසුගිය සභා රැස්වීමට ඉදිරිපත් වූ යෝජනා විෂය නිලධාරීන් වෙත යොමුකර ඇති බව,ප්‍රකාශ කරන ලදී.

## 9. වෙනත් කරුණු

### 9.1. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.ඒ.ගුණතිලක මැතිතුමා

ජීවනෝපාය භාණ්ඩ බෙදා දීමේ වැඩසටහන යටතේ පරගහමඩිත්ත ග්‍රාම නිලධාරී වසමේ ගරු මන්ත්‍රීතුමා විසින් නම් කරන ලද පුද්ගලයාගේ නම ඉවත් කර අදාල නිලධාරියාගේ ඥාතියෙකුට එම භාණ්ඩ ලබාදී ඇති බවට චෝදනා කළ ගරු මන්ත්‍රීතුමා මෙම භාණ්ඩ බෙදාදීම අත්තනෝමතික ලෙස නිලධාරීන්ගේ උවමනාවන්ට සිදුවන බවට කරුණු අනාවරණය කළේය.

වැලිගෙපොල ප්‍රාදේශීය ලේකම් ඇතුළු නිලධාරීන් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වරුන්ගේ ගෞරවය හා අන්‍යතාවයට අපහාස වන අයුරින් කටයුතු කරන බවත්, කමිටු රැස්වීම් වලදී ගරු මන්ත්‍රීතුමන්ලාගේ අදහස් හා යෝජනා නොසලකා හරිමින් කටයුතු කරන බවටත් කරුණු දැක්වූ ගරු මන්ත්‍රීතුමා මෙම තත්ත්වය පිළිබඳව ගරු ආණ්ඩුකාර තුමා ඇතුළු දිස්ත්‍රික් සංවිධායකතුමිය දැනුවත් කල යුතු බව සඳහන් කළේය.

තවද මෙම කරුණ සම්බන්ධයෙන් අදහස් දැක්වූ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ආර්.රත්නපාල මැතිතුමා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා හෝ සමෘද්ධි නිලධාරීන් හරහා භාණ්ඩ ලබා දීමේදී තෝරාගත් පිරිසකට පමණක් ප්‍රතිලාභ ලබාදෙන බවත් අවශ්‍යතාව ඇති වරප්‍රසාද හිමි විය යුතු පාර්ශවයන්ට වරප්‍රසාද හිමි නොවන බවත් පෙන්වා දෙන ලදී.

එසේම කොට්ඨාශය ජනතාව සමඟ සමීපව ඇසුරු කරන මහජන නියෝජිතයන් ඔවුන්ගේ අවශ්‍යතා හොඳ හැටි දන්නා හඳුනන බැවින් මහජන නියෝජිතයින්ගේ යෝජනා නොසලකා හරිම සුදුසු නොවන බවත් පැවසූ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.අයි.පී. රණතුංග මැතිතුමා වැලිගෙපොල ප්‍රාදේශීය ලේකම් ඇතුළු නිලධාරීන්ගේ මෙම ක්‍රියාකලාපය සම්බන්ධව වහා සොයා බලා විසඳුමක් ලබාදෙන ලෙස ඉල්ලා සිටියේය.

## 9.2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ආර්.රත්නපාල මැතිතුමා

හදගිරිය ගම්මානයෙන් බුරුතගොඩ ප්‍රදේශයේ බලපත්‍ර සහිත ඉඩම් වල ගම්වාසීන්ගොවිතැන් කටයුතු සිදු කරමින් සිටින අතර ඇතැම් කොටස් සඳහා ඉඩම් ඔප්පු නොමැති වුවත් වගා නොකරන ලද ඉඩම් ගොවීන් විසින් වගා කිරීම සඳහා යොදාගෙන ඇති බවත්,වන ආරක්ෂක නිලධාරීන් විසින් ගොවින්ට මෙම ඉඩම් වලින් පිටවන ලෙස බලපෑම් සිදු කරන බව පැවසූ ගරු මන්ත්‍රීතුමා බෙලිමාලියද්ද ,තිත්තවැල්කුණ්ඩිය යන ගම්මාන වලද ගොවීන් විසින් මහා පරිමාණ වශයෙන් වගාවන් සිදු කෙරෙන අතර එම ඉඩම කොටස් ද අත්පත් කර ගැනීමේ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක වන බැවින් ගොවීන්ට සිදු වී ඇති අසාධාරණය සොයා බලා සාධාරණයක් ඉටුකර දෙන ලෙස ඉල්ලා සිටියේය.

තවද පසුගිය දිනෙක වනඅලි නිවෙස් වලට කඩා වැදී විශාල ලෙස හානි සිදුකර ඇති බවත් වනජීවී නිලධාරීන්ට ද අලින් පලවා හැරීමට නොහැකි වූ බවත් පැවසූ ගරු මන්ත්‍රීතුමා, අලි පැමිණෙන ස්ථාන වල වීථි ලාම්පු සක්‍රිය කර දෙන ලෙස විටින් විට ඉල්ලීම් සිදුකල ද මෙතෙක් ක්‍රියාත්මක වී නොමැති බැවින් කඩිනමින් අදාල ස්ථාන සඳහා වීථි පහන් සවිකර දෙන ලෙස ඉල්ලා සිටියේය.

## 9.3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ජී.යූ.ඩබ්ලිව්.කුමාර මැතිතුමා

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.සී.එස්.ඉසුරුමුණි මැතිතුමාගේ අකල් මරණය සම්බන්ධයෙන් ඔහුගේ ඥාතීන් වෙත සිය ශෝකය ප්‍රකාශ කිරීමට අවස්ථාවක් කරගත් ගරු මන්ත්‍රීතුමා ප්‍රගතිශීලී උගත් මහජන නියෝජිතයෙකු ලෙස ගරු මන්ත්‍රීතුමා කල සේවාව අගයමින් එතුමාගේ අවමංගල්‍යය වෙනුවෙන් ගරු සභාපතිතුමා ඇතුළු කාර්ය මණ්ඩලයත් මන්ත්‍රී මණ්ඩලයත් දැක්වූ සහාය සම්බන්ධයෙන් සිය ස්තුතිය ප්‍රකාශ කළේය.

එසේම හත්තැල්ල මාර්ගයේ අලුතින් කාපට් කල කිලෝමීටර් 5ක පමණ කොටස තුල ස්ථාන 23කින් කැඩී ඇති බවත්, එය කඩිනමින් පිළිසකර කරන ලෙසත් ඉල්ලා සිටි ගරු මන්ත්‍රීතුමා,රජය වැඩ ලක්ෂයේ වැඩසටහන් ක්‍රියාත්මක කලද මේ වන විට එක සිමෙන්ති කොට්ටයක්වත් සොයා ගැනීමට නොහැකි තත්වයක් උද්ගත වී ඇති බවත්, මේ සම්බන්ධයෙන් පවතින රජය කඩිනමින් විසඳුම් සෙවිය යුතු බවත් ප්‍රකාශ කළේය.තවද ගොවීන්ට ආධාර ලබාදීම වෙනුවට පොහොර ගැටළුවට කඩිනම් විසඳුම් ලබාදිය යුතු බව ප්‍රකාශ කළ ගරු මන්ත්තුමා, ජීවනෝපාය භාණ්ඩ බෙදා දීම මේ වන තෙක් පැවති රජය හරහා සිදුකල අතර එම භාණ්ඩ බෙදා දීම නිලධාරීන්ට හෝ මහජන නියෝජිතයින්ට අවශ්‍ය පුද්ගලයින්ට නොව භාණ්ඩ අත්‍යවශ්‍ය හා එම භාණ්ඩ වලින් ප්‍රයෝජන ගැනීමට හැකියාව ඇති පුද්ගලයින්ට එම භාණ්ඩ බෙදා දීමේ වැඩපිළිවෙලක් සැකසිය යුතු බව සඳහන් කළේය.

## 9.4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී එන්.වී.ශ්‍රීමාවතී මැතිතුමිය

වසර හතරක කාලයක් පුරා සභාව තුල සහෝදරත්වයෙන් කටයුතු කල ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.සී.එස්.ඉසුරුමුණි මැතිතුමා ඉතා උගත් බුද්ධිමත් දේශපාලඥයෙකු ලෙස කල සේවාව අගයමින් ගරු මන්ත්‍රීතුමිය විසින් ඔහුට නිවන් සුව ප්‍රාර්ථනා කරන ලදී.

වසර තුනක කාලයක් පුරා රාජ්‍ය නිලධාරීන් සමග කම්වු හරහා සම්බන්ධ වෙමින් තමන් කටයුතු කල බවත් ඒ කාලයේ නිලධාරීන් සමඟ මෙවන් ගැටුම් ඇති නොවූ බවත් පැවසූ ගරු මන්ත්‍රීතුමිය පරගහ මඩිත්ත වසමේ සමෘද්ධි නිලධාරිනියගේ අත්තනෝමතික ක්‍රියාකලාපය තමන්ද හෙලා දකින බව පැවසුවාය. එසේම රාජ්‍ය නිලධාරීන් කිසිදු දේශපාලන පක්ෂයකට මැදිහත් නොවී අපක්ෂපාතීව කටයුතු කල යුතු බව ගරු මන්ත්‍රීතුමිය විසින් ප්‍රකාශ කරන ලදී.

තවද වැලිගෙපොල ප්‍රාදේශීය ලේකම් ඉවත් කිරීමට විවිධ පෙත්සම් ඉදිරිපත් වී ඇති බවට ආරංචි ලැබී ඇති බවත්, අනවශ්‍ය ලෙස නිලධාරීන් සමග ගැටුම් ඇතිකර නොගතයුතු බවත් ගරු මන්ත්‍රීතුමිය විසින් ප්‍රකාශ කරන ලදී.

## 9.5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ජී.ශාන්ත දෙල්ගහකොට්ටුව මැතිතුමා

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.සී.එස්.ඉසුරුමුණි මැතිතුමාගේ හදිසි අභාවය සම්බන්ධයෙන් එතුමාගේ ඥාතීන් වෙත ශෝකය ප්‍රකාශ කල ගරු මන්ත්‍රීතුමා එතුමාට නිවන් සුව ප්‍රාර්ථනා කළේය.

තව ද රට තුල පවතින පොහොර ගැටලුවේ ප්‍රතිඵලයක් ලෙස මේ දිනවල අස්වනු නෙලීමේදී බිසෝකොටුව ප්‍රදේශයේ කුඹුරු අක්කරයකට වී කවර එකහමාරක් පමණක් තිබූ බවත් අදාල මැෂිම සඳහා කුලිය ලෙස රුපියල් 3000ක මුදලක් වැය වී ඇති බවත් පෙන්වා දුන් ගරු මන්ත්‍රීතුමා රට තුල ගොවීන් දැඩි අපහසුතාවයට ලක් වී ඇති බව පෙන්වාදුන්නේය. ප්‍රදේශයේ සියලු අස්වනු හරි අඩකට වඩා වැඩි ප්‍රමාණයකින් අඩුවී ඇති අතර වන්දි ලබාදීම මෙයට විසඳුමක් නොවන බව පෙන්වා දුන් ගරු මන්ත්‍රීතුමා පොහොර ගැටළුවට මෙන්ම රට තුළ පවතින සිමෙන්ති හිඟයට ද වහා විසඳුම් ලබාදෙන ලෙස රජයට බලපෑම් කරන ලෙස ඉල්ලා සිටියේය.

## 9.6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එල්.ලාල් කුමාරරත්න මැතිතුමා

පරිසර හිතකාමී පුද්ගලයකු ලෙස විශාල සේවාවක් ඉටු කල ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.සී.එස්.ඉසුරුමුණි මැතිතුමාගේ අකල් වියෝව සම්බන්ධයෙන් පවුලේ ඥාතීන් වෙත ශෝකය ප්‍රකාශ කල ගරු මන්ත්‍රීතුමා මෙවන් අකල් මරණයක් මතු භවයකදී වත් සිදු නොවේවායි ප්‍රාර්ථනා කළේය.

වැඩිදුරටත් අදහස් දැක්වූ ගරු මන්ත්‍රීතුමා පෙර දිනක දි හදගිරිය ප්‍රදේශයේ වන අලි පහරදීමෙන් තුවාල ලබා කළුබෝවිල රෝහලේ ප්‍රතිකාර ලබන චන්ද්‍රවතී මහත්මිය බැලීමට තමන් ගිය බවත්, එතුමියට තමන්ගේ මාසික වැටුප පරිත්‍යාගය කල බවත් පැවසූ අතර සභාව මගින් එකඟ වූ පරිදි ඇය වෙත ලබාදීමට ඇති රුපියල් 50000/= ක ආධාර මුදල ලබාදීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටියේය.

තවද පැවැති පොහොර ගැටළුවත් සමඟ වී අස්වනු 80% කින් පමණ අඩු වී ඇති බවට කරුණු අනාවරණය කල ගරු මන්ත්‍රීතුමා රජය විසින් වී කිලෝවක මිල ඉහළ නැංවූ බවට ගොවීන්ට පැවසුවද එය රජයේ සිදුකල දෙයක් නොව අස්වනු අඩුවීම මත නිරායාසයෙන් සිදු වූවක් බව පෙන්වා දුන්නේය. රටේ උද්ගතවී ඇති විවිධ අර්බුද හමුවේ රජය සේවක අර්ථසාධක අරමුදල මගින් මුදල් ලබා ගැනීමේ වැයමක් පවතින බවත් එය කිසිසේත් සිදු නොකල යුතු කටයුත්තක් බවත් පෙන්වා දුන් ගරු මන්ත්‍රීතුමා ඉදිරි වසර තුනක කාලය තුල රටේ ජනතාව මෙම පත්වී ඇති අර්බුදයන්ගෙන් මුදවා රට ගොඩනැගීමට කටයුතු කල යුතු බවත්, මැතිවරණයකට යාමට මෙය සුදුසු කාලය නොවන බවත්, පෙන්වා දුන් අතර රට තුල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී රජය විසින් සිදුකරන සියලු ව්‍යාපෘති ග්‍රාමීය මට්ටමින් නිලධාරීන් හා ගම්වාසීන් සමඟ එක්ව විනිවිදභාවයකින් යුතුව සිදු කරන්නේ නම් මෙම ව්‍යාපෘතිය සාර්ථකව සිදු කල හැකි බවත් පෙන්වා දුන් ගරු මන්ත්‍රීතුමා රට අගාදයට යන බව ප්‍රකාශ කරමින් එතුමාගේ අදහස් දැක්වීම නිමා කළේය.

## 9.7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඒ.රෝහණ විජේරත්න මැතිතුමා

පරිසර හිතකාමී උගත් බුද්ධිමත් ප්‍රාදේශීය දේශපාලනඥයෙකු ලෙස ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.සී.එස්.ඉසුරුමුණි මැතිතුමා සභාව තුල තර්ක විතර්ක කරමින් තම මතවාදයන් වෙනුවෙන් නැගී සිටි යහපත් පුද්ගලයකු වන බවත්, එතුමාට නිවන්සුව ප්‍රාර්ථනා කිරීමට මෙය අවස්ථාවක් කර ගන්නා බවත් ප්‍රකාශ කල ගරු මන්ත්‍රීතුමා එතුමාගේ පවුලේ සියලු දෙනා වෙත සිය සාතිශය ශෝකය ප්‍රකාශ කළේය.

තවද රජය විසින් ගෙන යන කාපට් ලක්ෂයේ වැඩසටහන යටතේ බල ප්‍රදේශයේ ඇතැම් මාර්ගවල වැඩ කටයුතු අතරමග නැවතී ඇති බැවින් ඒ සම්බන්ධව සොයා බලා එම මාර්ග සංවර්ධනය කර දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලා සිටින ලදී.එසේම සෑම සභා වාරයකදීම හුණුවල ප්‍රාදේශීය රෝහලේ අඩු පහසුකම් සම්බන්ධයෙන් තමන් විවිධ අදහස් දැක්වුවද කිසිදු බලධාරියකු ඒ සම්බන්ධව සොයා බලා මේ වන තෙක් කිසිදු විසඳුමක් ලබා දී නොමැති බවට චෝදනා සිදුකල ගරු මන්ත්‍රීතුමා ප්‍රදේශයේ ජනතාවට ඉතාමත් වටිනා ස්ථානයක් වන මෙම ප්‍රාදේශීය රෝහල පිහිටීම අනුව ද ජනතාවට විශාල සේවාවක් ඉටු කළ හැකි ස්ථානයක් වන බැවින් එම රෝහල සංවර්ධනය කරගැනීමට අවශ්‍ය කටයුතු සලසන ලෙස ඉල්ලා සිටියේය.

## 9.8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ඒ.දමිත් විජේරත්න මැතිතුමා

රංවල කොට්ඨාශය තුල තමන් සමඟ සහෝදරත්වයෙන් කටයුතු කල ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.සී.එස්.ඉසුරුමුණි මැතිතුමාගේ අකල් වියෝව සම්බන්ධයෙන් සිය ශෝකය ප්‍රකාශ කල ගරු මන්ත්‍රීතුමා දක්ෂ දේශපාලනඥයකු හා නීතිඥයකු ලෙස එතුමා නොමැති අඩුව ජනතාවට බොහෝ සේ දැනෙනු ඇතැයි ප්‍රකාශ කල අතර එතුමාට කරන ගෞරවයක් ලෙස සභාවට එතුමා විසින් ඉදිරිපත් කල යෝජනා ඉටු කර දෙන ලෙස ඉල්ලා සිටියේය.

රටේ වර්තමාන තත්වය පිළිබඳව ගරු මන්ත්‍රීවරුන් විවිධ අදහස් දැක්වූ අතර මේ දිනවල සමෘද්ධිය කපා හැරීමක් සිදු වන අතර නාම ලේඛන සකස් කරමින් එක්සත් ජාතික පාක්ෂිකයින්ගේ සමෘද්ධිය කපා හැරීමක් මේ දිනවල සිදුවන බැවින් ඒ සම්බන්ධව සොයා බලා කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලා සිටින ලදී.

තවද රට තුල ජනතාව පත් වී ඇති මෙම මෙම අසීරුතාවන් වටහා ගැනීමට නම් අතිගරු ජනාධිපතිතුමා ගම් මට්ටමින් පැමිණිය යුතු බවත් එවිට වටහා ගත හැකි වන බවත් ප්‍රකාශ කල ගරු මන්ත්‍රීතුමා ,කුමන සංවර්ධන ව්‍යාපෘති සිදු කල ද ජනතාවගේ කුසගින්න ප්‍රමුඛ කොට ගෙන එයට විසඳුම් ප්‍රථමයෙන් ලබාදිය යුතු බවත්, ඉන් අනතුරුව රටේ සංවර්ධනය ගැන සොයා බැලිය යුතු බවත් ප්‍රකාශ කළේය.

## 9.9. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.බුද්ධික වීරසිංහ මැතිතුමා

2018 වර්ෂයේ පැවැති ප්‍රාදේශීය සභා මැතිවරණයෙන් තේරීපත්වූ ජනතා හිතවාදියෙකු ලෙස ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.සී.එස්.ඉසුරුමුණි මැතිතුමා වැලිගෙපොල ප්‍රාදේශීය සභාව තුල ඔහුගේ මතය පතුරවමින් ජනතාවට සේවයක් කිරීමට කැප වූ උගත් බුද්ධිමත් පුද්ගලයෙකු බවත්, මෙම සභාවේ නීතිඥ වෘත්තියේ නියුතු සභිකවරුන් දෙදෙනෙකු සිටින සභාවක් ලෙස කීර්තියට පත් කිරීමට එතුමාද සමත් වූ බවත් පැවසූ ගරු මන්ත්‍රීතුමා, තමාගේ ගමේ එකට සහෝදරත්වයෙන් දේශපාලනයේ නිරත වූ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.සී.එස්.ඉසුරුමුණි මැතිතුමාට නිවන් සුව ප්‍රාර්ථනා කරමින් ඔහුගේ අවමංගල්‍යයට සහය දැක්වූ සියලු දෙනාට සිය ස්තූතිය ප්‍රකාශ කළේය.

තවද, විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා විසින් ඉදිරිපත් කළ දේශපාලන මත වාද සම්බන්ධයෙන් අදහස් දැක්වූ ගරු මන්ත්‍රීතුමා තම කොට්ඨාශයේ කිසිදු පුද්ගලයකුගේ සමෘද්ධි සහනාධාර කපා හැරීම සම්බන්ධයෙන් තමන් මැදිහත් නොවූ බව ප්‍රකාශ කල අතර දැක්වූ මතවාදයන්ට පිළිතුරු දීමට මෙය අවස්ථාව නොවන බව ප්‍රකාශ කළේය.

## 9.10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.සිසිර ප්‍රේමකුමාර මැතිතුමා

2018 වර්ෂයේ ප්‍රාදේශීය සභා මැතිවරණයෙන් තරග කර ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නියෝජනය කරමින් වැලිගෙපොල ප්‍රාදේශීය සභාවට තේරී පත්වූ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.සී.එස්.ඉසුරුමුණි මැතිතුමා, ප්‍රදේශයේ ජනතාවගේ හඬ වෙනුවෙන් නැඟී සිටිමින් ජනතාව සමග එක්ව ඔවුන්ගේ ඉල්ලීම් ඉටුකර ගැනීම උදෙසා උද්ඝෝෂණ ආදියට එක්වෙමින් ජනතාව සමග සිටි ඉතා උගත් බුද්ධිමත් දේශපාලඥයකු ලෙස කල සේවාව ඇගයීමට ලක් කල ගරු මන්ත්‍රීතුමා එතුමාගේ

අවමංගල්‍යය සඳහා අවසන් ගෞරව දැක්වීමට සහභාගි වූ සියලු ගරු මන්ත්‍රීතුමන්ලාට හා කාර්ය මණ්ඩලයට සිය ස්තූතිය ප්‍රකාශ කල අතර එතුමාට නිවන් සුව ප්‍රාර්ථනා කළේය.

### 9.11. ගරු උප සභාපති ඩබ්ලිව්.ඒ.සමන්ජීවලාල් වීරසිංහ මැතිතුමා

වසර හතරක කාලයක් පුරා වැලිගෙපොල ප්‍රාදේශීය සභාව තුල රංවල කොට්ඨාශය නියෝජනය කරමින් දේශපාලන කටයුතුවල නියැලී සිටි ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.සී.එස්.ඉසුරුමුණි මැතිතුමා ස්වභාදහමට බෙහෙවින් ඇලුම් කල පරිසර හිතකාමී නායකයෙකු ලෙස සේවය කල බවත් එතුමා විවිධ මත පල කරමින් සහෝදරත්වයෙන් දේශපාලනයේ නියැළුනු බවත් ප්‍රකාශ කල ගරු උප සභාපතිතුමා, මෙවන් අකල් මරණයකට මතු භවයක දී ගොදුරු නොවේවායි ප්‍රාර්ථනා කරමින් එතුමාට නිවන් සුව ප්‍රාර්ථනා කළේය. එසේම එතුමාට කරන ගෞරවයක් ලෙස එතුමා විසින් එම කොට්ඨාශය වෙනුවෙන් ඉදිරිපත් කල යෝජනා ඉටුකර දීමට කටයුතු කරන ලෙස ද ඉල්ලා සිටියේය.

### 9.12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එච්.සිරිපාල මැතිතුමා

වසර හතරක කාලයක් පුරා සහෝදරත්වයෙන් දේශපාලනයේ නියැලුනු ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.සී.එස්.ඉසුරුමුණි මැතිතුමාගේ අකල් වියෝව විශාල පාඩුවක් වන බවත් එතුමා පරිසර හිතකාමීව සිදු කළ සේවාවන් බල ප්‍රදේශයෙන් බැහැරවද සිදු කල බවත් පෙන්වා දුන් ගරු මන්ත්‍රීතුමා එතුමාට නිවන් සුව ප්‍රාර්ථනා කළේය.

**සභා රැස්වීමේ නිමාව**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.සී.එස්.ඉසුරුමුණි මැතිතුමාගේ අභාවය වෙනුවෙන් මෙම සභාවාරය ආරම්භයේදී එතුමා සිහි කරමින් විනාඩි දෙකක නිෂ්ශබ්දතාවයක් රකිමින් වෙනත් කරුණු යටතේ සියලු ගරු මන්ත්‍රීතුමන්ලාට එතුමන් වෙනුවෙන් ශෝකය ප්‍රකාශ කිරීමට අවස්ථාවක් සලසා දුන් බව පැවසූ ගරු සභාපතිතුමා, එතුමාගේ අවමංගල්‍යය වෙනුවෙන් සභාව විසින් සිදු කල යුතු දේ සොයා බලා ඒ සියළු දේ ලබා දුන් බවත් ප්‍රකාශ කළේය. එසේම සභාවේ සිටි පරිසර හිතකාමී පුද්ගලයෙකු ලෙස එතුමා විශාල සේවාවක් ඉටු කල බවත් නීතිඥවරයෙකු ලෙස ද ජනතාවට විශාල සේවාවක් ඉටු කල අතර එතුමාගේ අභාවයෙන් එතුමා නොමැති අඩුව ජනතාවට විශාල ලෙස දැනෙනු ඇතැයි ප්‍රකාශ කල ගරු සභාපතිතුමා එතුමාගේ ඥාතීන් වෙත සිය ශෝකය ප්‍රකාශ කරමින් එතුමාට නිවන් සුව ප්‍රාර්ථනා කළේය.

එසේම රටක් ලෙස ඉදිරියට යන ගමනේ රජය විසින් ගනු ලබන තීන්දු තීරණ ජනතා වෙත රැගෙන යාමේ දී ඇතැම් ගැටළු මතුවන බවත් දේශපාලනඥයින් මෙන්ම නිලධාරීන්ද රට ඉදිරියට ගෙන යාම සඳහා එක්ව කටයුතු කල යුතු බවත්, පැවසූ ගරු සභාපතිතුමා අද දින රැස්වීමේ කටයුතු සාර්ථකව කරගෙන යාමට සහය ලබාදුන් සියළු දෙනාට සිය ස්තූතිය පුදකරමින් ප.ව. 1.15 ට පමණ සභා රැස්වීමේ කටයුතු නිමාවට පත් කළේය.

කැළුම් ප්‍රියංකර ජයසිංහ,
සභාපති,
වැලිගෙපොල ප්‍රාදේශීය සභාව